UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

# GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2016
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2016

## දේශපාලන විද්‍යාව/Political Science (PSG: I)
## දේශපාලන සහ සමාජ න්‍යාය

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලයඃ පැය **තුනයි.**

---

01. දේශපාලන සමාජ න්‍යායේ ස්වභාවය හා ක්ෂේත්‍රය පිළිබඳ විස්තර කොට, එය විෂයක් ලෙස අධ්‍යයනය කිරීමේ ප්‍රයෝජනවත් බව පරීක්ෂා කරන්න.

02. රාජ්‍ය පිළිබඳ වන දේශපාලන න්‍යාය වර්ධනයට ඇරිස්ටෝටල්ගෙන් සිදු වූ දායකත්වය පිළිබඳ අදහස් දක්වන්න.

03. පුද්ගලික දේපළ සංකල්පය පිළිබඳ ජෝන් ලොක් ඉදිරිපත් කළ අදහස් විස්තර කරන්න.

04. "නිකලෝ මැකියාවේලි, මධ්‍යතන හා නූතන දේශපාලන චින්තකයන් දෙකේ සීමාවන් අතර ස්ථානයක ස්ථානගතව සිටී." අදහස් දක්වන්න.

05. සමාජ සම්මුති න්‍යාය පිළිබඳ තෝමස් හොබ්ස් හා රූසෝ ඉදිරිපත් කරන ලද අදහස් සන්සන්දනය කරන්න.

06. පහත සඳහන් මාතෘකා අතරින් <u>එකක්</u> යටතේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංකල්පය පිළිබඳ විවේචනාත්මක රචනාවක් ලියන්න.

    i) ප්‍රජාතන්ත්‍රවාදයේ විශේෂ ලක්ෂණ
    ii) සාර්ථක ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් සඳහා අත්‍යවශ්‍ය වන්නාවූ සාධක

07. වත්මන් සමාජයේ පංති ව්‍යුහය විස්තර කිරීමට ඇති අදාළත්වය කෙරේ විශේෂ අවධානය යොමු කරමින් පංති අරගලය පිළිබඳ මාක්ස්වාදී අදහස් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

අ.පි.බ.

08. පහත සංකල්ප අතුරින් **ඕනෑම එක් සංකල්පයක** මූලික ශක්තීන් හා දුර්වලතා විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

i) සමානාත්මතාවය පිළිබඳ සංකල්පය
ii) නිදහස පිළිබඳ සංකල්පය

09. "දෙවැනි ලෝක යුද්ධය නිමාවෙන් පසුව පවා සමහර දේශපාලන ක්‍රම විස්තර කිරීමේදී ෆැසිස්ට්වාදය අදාළ වී තිබේ". ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් **ඕනෑම දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i) යුටෝපියන් සමාජවාදය.
ii) රාජ්‍ය පිළිබඳ වන බෞද්ධ න්‍යාය
iii) රෝම නීතිය පිළිබඳ සිසරෝගේ අදහස්
iv) ස්වාධිපත්‍ය සංකල්පය පිළිබඳ ජීන් බොඩෑන්ගේ අදහස්

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2016
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2016

දේශපාලන විද්‍යාව/Political Science (PSG: II)
ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලයඃ පැය **තුනයි.**

---

01. "ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය මහජනතාව මත පදනම් වූ ව්‍යාපාරයක් නොවීය". ඔබ එකඟවන්නෙහිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

02. ලාංකික දේශපාලන සංවිධාන ඩොනමෝර් කොමසාරිස්වරු හමුවේ ඉදිරිපත් කරන ලද ප්‍රධාන ගැටළු හා ඉල්ලීම් පිළිබඳව අදහස් දක්වන්න.

03. "1931 වසරේදී සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම ශ්‍රී ලංකා දේශපාලනයේ නව යුගයක ආරම්භය සනිටුහන් කළේය. සාකච්ඡා කරන්න.

04. සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි කිරීමට පක්ෂව ඉදිරිපත් කරන ලද තර්ක විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

05. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ "ආගමික සාධකය" විසින් ඉටුකරන ලද භූමිකාව ඔබ තක්සේරු කරන්නේ කෙසේද?

06. ද්විසභාග ක්‍රමයක් ලෙසින් ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය විස්තර කිරීම කොතරම් දුරට නිවැරදිද?

07. ශ්‍රී ලංකාවේ පවතින මැතිවරණ ක්‍රමයේ දුර්වලතා පිළිබඳ විවේචනාත්මක රචනයක් ලියන්න.

08. ශ්‍රී ලංකාව වැනි රටකට වඩා යෝග්‍ය වන්නේ ජනාධිපති ක්‍රමයකට වඩා කැබිනට් ආණ්ඩුක්‍රමයක්ය යන අදහස සමඟ ඔබ එකඟ වන්නෙහිද?

09. වර්තමාන පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යයන් 1972 ව්‍යවස්ථාව යටතේ පැවැති ජාතික රාජ්‍ය සභාවේ බලතල සහ කාර්යයන් සමඟ සසඳන්න.

10. "ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයේ වර්ධනය සඳහා දහනම වන ව්‍යවස්ථාව සංශෝධනයෙන් පදනම සකස් කළේය". මෙම ප්‍රකාශය විවේචනාත්මකව පරීක්‍ෂා කරන්න.

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2016
ශාස්ත්‍රවේදි සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2016

දේශපාලන විද්‍යාව/Political Science (PSG: III)
රාජ්‍ය පරිපාලන විද්‍යාව

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලය: පැය තුනයි.

---

01. රාජ්‍ය පරිපාලනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? අධ්‍යයන විෂයක් ලෙස එහි ආරම්භය සහ සංවර්ධනය කෙටියෙන් පහදන්න.

02. "රාජ්‍ය පරිපාලනය සහ දේශපාලනය අතර සම්බන්ධය වැළැක්විය නොහැක". මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03. අවිධිමත් සංවිධානය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? අවිධිමත් සහ විධිමත් සංවිධාන අතර ක්‍රියාකාරීත්වය විස්තර කරන්න.

04. පහත සඳහන් **ඕනෑම දෙකක්** කෙටියෙන් විභාග කරන්න.

(අ) ෆෙඩ්රික් වින්ස්ලෝ ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණ න්‍යාය
(ආ) ශ්‍රී ලංකාවේ නව රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ
(ඇ) සංවිධාන න්‍යායට එල්ටන් මේයෝගේ දායකත්වය
(ඈ) ප්‍රංශ සිවිල් සේවාවේ ස්වීයත්වය

05. වර්තමාන පරිපාලන ක්‍රම තුළ මැක්ස් වෙබර්ගේ පරමාදර්ශී නිලබල ක්‍රමයෙහි ප්‍රායෝගිකත්වය විවේචනාත්මකව විභාග කරන්න.

06. බ්‍රිතාන්‍ය සිවිල් සේවාවේ සංවර්ධනයට ෆුල්ටන් කමිටු වාර්තාව (1968) මගින් සිදු වූ දායකත්වය අගයන්න.

07. "ශ්‍රී ලංකාවේ බලය බෙදීමේ ආකෘතියෙහි ඇති දුර්වලතා හේතුවෙන් පළාත් රාජ්‍ය පරිපාලනය ගැටළු සහ අභියෝග වලට මුහුණ පා ඇත". සාකච්ඡා කරන්න.

08. "රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරීත්වය හේතුවෙන් නූතන රාජ්‍යයන්හි රාජ්‍ය පරිපාලනයේ කාර්යභාරය සහ ක්‍රියාකාරීත්වය අවප්‍රමාණය වෙමින් පවතී" විභාග කරන්න.

අ.පි.බ.

09. "ශ්‍රී ලංකාවේ යහපත් ආණ්ඩුකරණය සහතික කිරීමේදී රාජ්‍ය පරිපාලනයේ කාර්යභාරය සුවිශේෂී වේ". ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

10. පහත සඳහන් **<u>ඕනෑම දෙකක්</u>** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) විද්‍යුත් ආණ්ඩුකරණය

(ආ) ලූතර් ගුලික්

(ඇ) නව රාජ්‍ය පරිපාලනය

(ඈ) ඇමෙරිකානු සිවිල් සේවාවේ මූලික ලක්ෂණ

(ඉ) 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව